සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.

# අවසාන වාර පරීක්ෂණය 2015

# පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය

**11 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

නම/ විභාග අංකයඃ

## I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 සංවර්ධන ඉලක්ක කරා යෑමට උදව් වන සංවර්ධන ක්‍රියාමාර්ගයක් නොවන්නේ,

(1) ග්‍රාමීය සංවර්ධනය (2) නාගරික සංවර්ධනය

(3) කාර්මික සංවර්ධනය (4) මාර්ග සංවර්ධනය

02 ශ්‍රී ලංකාවේ පරිසර දූෂණය අවම වූ ස්ථානයකි

(1) හෝර්ටන් තැන්න (2) මහියංගනය

(3) පිටකොටුව (4) මහනුවර

03 පරිසරය සකස්වී ඇති සංරචක ප්‍රධාන කොටස් ගණන,

(1) 3 කි. (2) 2 කි. (3) 4 කි. (4) 6 කි.

04 නවීන විද්‍යාවට අනුව සිදුවූ වෙනස්කමක් නොවන්නේ,

(1) ශීඝ්‍ර ජනගහන වර්ධනය (2) කාර්මීකරණය

(3) අධ්‍යාපනය ඉහළ යෑම (4) නාගරීකරණය

05 වායුගෝලයේ ඔක්සිජන් සංයුතිය වන්නේ,

(1) 78.03% කි. (2) 20.99% කි. (3) 0.90% කි. (4) 0.03% කි.

06 ජෛව සම්පත් හායනය යනු,

(1) ශාක හා සතුන් විනාශ වීම. (2) සමුද්‍ර ජල මට්ටම ඉහළ යාම.

(3) අම්ල වැසි ඇතිවීම. (4) සමේ පිළිකා ඇතිවීම.

07 දළ ජාතික නිෂ්පාදනය

(1) දළ දේශීය නිෂ්පාදනය + විදේශීය ශුද්ධ සාධක ආදායම.

(2) දළ ජාතික නිෂ්පාදනය + භෞතික ජීවන තත්ත්ව දර්ශකය

(3) මානව දරිද්‍රතා දර්ශකය + මානව පීඩන දර්ශකය

(4) මූර්ත දළ ජාතික නිෂ්පාදනය + ආර්ථික වර්ධන වේගය

08 කිසියම් රටක් ළඟාකරගෙන ඇති දියුණුව මූලික වශයෙන් සංරචක කීයක් යටතේ ඇගයීමට ලක්කරයි ද?

(1) 3 යි. (2) 4 යි. (3) 8 යි. (4) 12 යි.

09 තිරසාර සංවර්ධනයක් ළඟාකර ගැනීම සඳහා සම්පූර්ණ කරගතයුතු අවශ්‍යතාවයක් නොවන්නේ,

(1) පරිසර අවශ්‍යතා (2) සාමාජයීය අවශ්‍යතා

(3) ආර්ථික අවශ්‍යතා (4) භෞතික අවශ්‍යතා

10 ජාත්‍යන්තර සබඳතා ප්‍රධාන අංශ කීයක් යටතේ පවත්වාගෙන යනු ලැබේ ද?

(1) 2 යි. (2) 3 යි. (3) 4 යි. (4) 5 යි.

- නිවැරදි ලෙස A හා B තීර ගලපා යා කරන්න.

| | A | | B |
|---|---|---|---|
| 11 | කැලෑ ආඥාපනත | (a) | 1919 |
| 12 | සතුන්ට හිංසා කිරීමෙන් වැළකීමේ පනත | (b) | 1948 |
| 13 | නිවාස හා නගර සංවර්ධන ආඥාපනත | (c) | 1946 |
| 14 | වෙරළ සංරක්ෂණ පනත | (d) | 1945 |
| 15 | මහවැලි අධිකාරී පනත | (e) | 1985 |
| 16 | ජාතික පරිසර පනත | (f) | 1907 |
| 17 | අන්තර් ජාතික ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුව | (g) | 1976 |
| 18 | ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) | (h) | 1915 |
| 19 | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල | (i) | 1981 |
| 20 | ලෝක කම්කරු සංවිධානය | (j) | 1979 |

- පහත සඳහන් ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

(FAO / ILO / 54 / 15 / 7 / සාර්ක් සංවිධානය / නේටෝ සංවිධානය / සාම ක්‍රියාවලි / ශ්‍රේෂ්ඨාධිකරණය / මහාධිකරණය)

21 ප්‍රබල රාජ්‍යයන් දුබල රාජ්‍යයන් කෙරෙහි බලපෑම් කරන ක්ෂේත්‍රයකි ..................................................................

22 ප්‍රාදේශීය, සාමූහික සුරක්ෂිතතාව වෙනුවෙන් ගොඩනගන ලද මිලිටරි සංවිධානයකි ...................................................................

23 ප්‍රාදේශීය ආර්ථික සමාජයීය හා දේශපාලන සහයෝගීතාව සඳහා ගොඩනගත ලද සංවිධානයකි ................................................

24 එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අරක්ෂක මණ්ඩලයේ සාමාජිකයින් ගණන ......................

25 එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආර්ථික හා සමාජ මණ්ඩලයේ සාමාජිකයින් ගණන ................................................

26 ලෝක ආහාර හා කෘෂි කාර්මික සංවිධානය හඳුන්වන කෙටි අක්ෂර වන්නේ ................................................

27 ජාත්‍යන්තර කම්කරු සංවිධානය හඳුන්වන කෙටි අක්ෂරය වන්නේ ....................................

28 සියලු අපරාධ පිළිබඳ අධිකරණ බලය හිමිවන අධිකරණය වන්නේ ....................................

29 අභියාචනා කිරීමේ අවසරය ඇති අධිකරණය වන්නේ ................................................................

30 සාර්ක් සංවිධානයේ සාමාජික රටවල් ගණන ....................................................................................

- පහත සඳහන් ප්‍රකාශ හරිනම් (✓) ලකුණ ද, වැරදිනම් (✗) ලකුණ ද දී ඇති වරහන් තුළ යොදන්න.

31 ජාත්‍යන්තර සම්බන්ධතා මාධ්‍ය ලෙස තානාපති සේවය හැඳින්විය හැකිය. (   )

32 පාරිසරික ගැටලුවලට මිනිස් ක්‍රියාකාරකම් පමණක් හේතු වේ. (   )

33 නූතන සංවර්ධන ක්‍රියාදාමය තුළ ජනතාවගේ ජීවන තත්ත්වය පහත හෙළයි. (   )

The National e-learning Portal for The General Education

34 කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සීඩෝ සම්මුතිය ඇතුළු විවිධ සම්මුතීන් සම්මත කර තිබේ. ( )

35 අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා සෑම පුරවැසියෙකුම තම වගකීම් ඉටුකළ යුතුම නැත. ( )

36 ශ්‍රී ලංකාව යනු සන්ධීය රාජ්‍යයකි. ( )

37 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වෙනි සංශෝධනය යටතේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කර ඇත. ( )

38 නීතිය ඉදිරියේ සියලු දෙනාට සමානව සැලකීම නීතියේ ආධිපත්‍ය නම් වේ. ( )

39 රටක උත්තරීතර නීතිය ශ්‍රේෂ්ඨාධිකරණයයි. ( )

40 අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමේ විධි විධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම සලසා ඇත. ( )

(ල. 40)

## II කොටස

- **ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

01 (1) පරිසරය යනු කුමක්දැයි නිර්වචනය කර ලියන්න. (ල. 03)

(2) පරිසරයේ ප්‍රධාන සංරචක උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 06)

(3) වර්තමානයේ වැඩි අවධානයක් යොමුවී ඇති පාරිසරික ගැටළු 5 ක් නම් කරන්න. (ල. 06)

02 (1) සංවර්ධනය යනු කුමක්දැයි නිර්වචනය කරන්න. (ල. 03)

(2) සංවර්ධන මිනුම් කොටස් දෙක තුළ අඩංගු මිනුම් සටහනකින් ඇඳ පෙන්වන්න. (ල. 06)

(3) තිරසාර සංවර්ධනය ළඟාකර ගැනීම සඳහා සම්පූර්ණ කරගත යුතු අවශ්‍යතා විස්තර කරන්න. (ල. 06)

03 (1) ජාත්‍යන්තර සබඳතා යනු කුමක්දැයි හඳුන්වන්න. (ල. 03)

(2) ජාත්‍යන්තර සංවිධාන ප්‍රධාන කොටස් කීයද? (ල. 06)

(3) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන ආයතන කීයද? ඒවා නම්කර ඉන් එකක බලතල හා කාර්යයන් විස්තර කරන්න. (ල. 06)

04 (1) නීතියක් බිහිවීමෙහිලා බලපාන මූලාශ්‍ර 5 ක් ලියන්න. (ල. 03)

(2) දේශීය නීතියෙහි ප්‍රභේද රූප සටහනකින් දක්වන්න. (ල. 06)

(3) මානව හිමිකම් කොමිසමේ බලතල 6 ක් ලියන්න. (ල. 06)

05 (1) මධ්‍යම ආණ්ඩුවේ බලතල හා කාර්යයන් 3 බැගින් ලියන්න. (ල. 05)

(2) 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය හා 1972 පළමු ජනරජ ව්‍යවස්ථාවේ ව්‍යවස්ථාදායකයේ වෙනස්කම් 2 ක් විස්තර කරන්න. (ල. 05)

(3) යහපාලනය හා එහි ගුණාංග විස්තර කරන්න. (ල. 05)